# 5

# THE IMPACT OF HUMAN ELEPHANT CONFLICTS ON THE FAMILY LIFE OF DRY ZONE PEOPLE AND THE ROLE OF SOCIAL WORK IN MINIMIZING THE ISSUE

## අලි මිනිස් ගැටුම වියළි කලාපයේ ජන ජීවිතයට හා පවුල් ඒකකයට සිදු කරන බලපෑම හා එය අවම කිරීම සඳහා සමාජ වෘත්තිවේදී දායකත්වය

**Dr.M.T.M. Mahees**
*Senior Lecturer, Department of Sociology, University of Colombo, Sri Lanka.*

**R.D.S. Rajapaksha**
*Teacher and Social Sciences Researcher*

**Abstract:** The human wildlife conflicts have become worst scenario in Sri Lanka due to unsustainable development activities and various political ecological issues. Today human elephant conflicts have been identified as a leading socio-environmental problem of the country. This crisis is mainly found among the farming community of dry zone and many mitigation plans put forward became fruitless. However, it reveals that ecological social works are supposed to be good solution to this problem in many other parts of the world according to the existing literature based on green social works. The primary objective this paper is to analyse the impact of human elephant conflict on the social and family life of people in dry zone. This paper also looks at the role of social workers in minimizing the grievances of people affected by the conflict in dry zone. The methodology of this paper is based on the existing knowledge in the relevant literature and primary data collected from Dehiattakandiya divisional secretariat of Mahaweli zone. The data was qualitatively analysed based on themes and discourses such as vulnerability, social risk, ecological democracy and green social work. The human elephant conflict has made entire life of dry zone farmers complicated and vulnerable. It has negatively influenced the husband-wife relationship, socio-physiological life family and marriage and education of children. The politicized mitigation actions and compensation programs have created many new livelihood and gender challenges among the dry zone families. Farmers are adapting to new social risk life depending the complexities of human wildlife conflicts. The contribution of ecological social work is very minimum in the context of human wildlife conflicts in Sri Lanka.

**Key words :** Human elphant conflict, Dry zone farming families, Political ecology, Green social work

**සංක්ෂේපය:** ශ්‍රී ලංකාව තුළ වර්තමානයේ සිදුවෙමින් පවත්නා තිරසර නොවන සංවර්ධන ක්‍රියාදාමය මගින් හා දේශපාලන පාරිසරික විද්‍යාත්මක සාධක හේතු කොට වනසත්ව හා මිනිස් ගැටුම උග්‍ර සමාජ පාරිසරික ප්‍රශ්නයක් බවට පත්ව ඇත. අලි මිනිස් ගැටුම අද වන විට ප්‍රබලම අභියෝගය බවට පත්ව ඇත. මෙම ප්‍රශ්නය විසඳීමට පාරිසරික සමාජ වෘත්තිවේදයේ කාර්යභාරය ඉතාම වැදගත් එකක් බව සාහිත්‍ය විමර්ශනය තුළින් පෙනීයයි. වියළි කලාපය තුළ සිදුවන මෙම ව්‍යසනය විසඳීමට නොයෙක් ක්‍රම අත්හදා බැලුවත් ඒවායින් බොහෝමයක් අසාර්ථක වී ඇත. එම නිසා බොහෝ පාරිසර ගැටලු මෙන්ම ආපදාවන් අවම කිරීම සඳහා යොදා ගන්නා හරිත සමාජ වෘත්තයිවේද මෙයට ද සුදුසු යැයි උපකල්පනය කළ හැකිය. මෙම ලිපියේ ප්‍රධාන අරමුණ බවට පත්වූයේ වර්තමානයේ ප්‍රබලව පවතින වනසත්ත්ව හා මිනිස් ගැටුම් අතරින් ප්‍රමුඛත්වයෙහිලා සැළකෙන අලි මිනිස් ගැටුම වියළි කලාපීය ජන ජීවිතයට හා පවුල් ඒකකයන්ට සිදුකරන බලපෑම පිළිබඳව විශ්ලේෂණය කිරීමයි. මෙම පර්යේෂණ ලිපිය දැනට සිදුකොට ඇති පර්යේෂණ හා ද්විතියික තොරතුරු මෙන්ම මහවැලි කලාපයට අයත් දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ වර්තමානයේ

අලි මිනිස් ගැටුම පිළිබඳ දත්ත, අහිමිවන මිනිස් ජීවිත, දේපල හානි ආදි තොරතුරු මත සිදු කළ ක්ෂේත්‍ර අධ්‍යයනයක් මත පදනම් වේ. මෙම පර්යේෂණාත්මක ලිපිය සඳහා අවශ්‍ය ප්‍රාථමික දත්ත හා තොරතුරු ලබාගැනීමේදී ගුණාත්මක දත්ත ලබාගැනීමේ විධික්‍රමය ලෙස සම්මුඛ සාකච්ඡා ක්‍රමය ප්‍රමුඛ වූ අතර නිරීක්ෂණ ක්‍රමවේදය හා ප්‍රශ්නාවලියක් ද යොදාගන්නා ලදී. මීට අමතරව ද්විතියික දත්ත ඒකරාශි කිරිමේදි අලි මිනිස් ගැටුමට අදාළව තොරතුරු ඒකරාශි කරන ලදී. එහිදී වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අලි සංරක්ෂණ අංශය සතු වූ වාර්තා, අලි මිනිස් ගැටුම පිළිබඳ කරන ලද පර්යේෂණ වාර්තා, ඒ පිළිබඳ ලියැවුණු පොත්, පුවත්පත්, ලිපි, සඟරා ආදිය මගින් ද තොරතුරු ලබා ගන්නා ලදී. අලි මිනිස් ගැටුම වියළි කලාපයේ සාමාන්‍ය ජන ජීවිතය ව්‍යාකූලත්වයට පත්කරන ප්‍රධාන සාධකයක් බවට පත්ව ඇත. එහිදී විශේෂයෙන්ම විවාහ ජීවිතයේ අඹුසැමි සම්බන්ධතා වැනි මනෝවිද්‍යාත්මක සාධකවලින් ඇරඹී දරුවන්ගේ අධ්‍යාපනයට, ග්‍රාමීය කෘෂි ආර්ථිකයට මෙන්ම අනෙකුත් සමාජ, ආර්ථික අංශයන් කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කරනු ලබයි. එපමණක් නොව අලි මිනිස් ගැටුමෙන් පීඩාවට පත්ව සිටින මෙම ජනතාවට යම් සහනයක් ලබාදීමේ අරමුණෙන් ක්‍රියාත්මක වන රාජ්‍ය ප්‍රතිපත්ති පවා ඇතැම් අවස්ථාවල ඔවුන්ගේ ජන ජීවිතය තව දුරටත් දරිද්‍රතාවයට පත්කිරීමට මෙන්ම ස්ත්‍රී පුරුෂ සමාජභාවීය විෂමතාවන් සමාජය තුළ ස්ථාවර කිරීමට ද දායක වන බව කිව හැකිය. මෙම සියලු තත්වයන් හමුවේ වියළි කලාපයේ ජනතාව අලි මිනිස් ගැටුම හමුවේ ජීවිත අවදානම බාර ගනිමින් පවතින තත්වයන්ට අනුවර්තනය වෙමින් කටයුතු කිරීමක් ද හඳුනාගත හැකිය.

**ප්‍රමුඛ පද:** අලි මිනිස් ගැටුම, වියළි කලාපයේ ගොවි පවුල්, දේශපාලන පරිසර විද්‍යාව, හරිත සමාජ වෘත්තිවේදය

## ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සඳහා මිශ්‍ර දත්ත රැස් කිරීමේ ක්‍රමවේදයක් යොදා ගන්නා ලදී. අලි මිනිස් ගැටුම තුළින් දෛනික ජන ජීවිතයට මෙන්ම පවුල් ජීවිතයට සිදුවන සමාජ, දේශපාලනික කරුණු ගුණාත්මකව අවබෝධ කර ගත්තත් සමාජ විද්‍යාත්මක ප්‍රවේශයක් යොදා ගන්නා ලදී. මෙම පර්යේෂණ පත්‍රිකාව සඳහා ප්‍රධාන වශයෙන් ද්විතීයික දත්ත භාවිත කොට ඇත. ඒ සඳහා දැනට දක්නට ලැබෙන වනජීවී අමාත්‍යාංශයේ ලේඛන හා අනෙකුත් මූලාශ්‍ර මෙන්ම රජයේ ද්විතීයික තොරතුරු යොදාගෙන ඇත. එමෙන්ම මෙම අධ්‍යයනය සඳහා අලි මිනිස් ගැටුම මෙන්ම ඒ තුළින් ඇතිවන දේශපාලනික ගැටලු ජන ජීවිතයට බලපාන ආකාරය පිළිබඳ සාහිත්‍ය සමාජ විද්‍යාත්මක පරිකල්පනයකින් අන්තර්ගත කොට ඇත. මෙහි වැඩි වශයෙන් ද්විතීයික දත්ත සහ දැනට පවතින සාහිත්‍ය යොදාගනු ලැබුවත් ඒවා තවදුරටත් තහවුරු කර ගැනීම පිණිස ප්‍රාථමික දත්ත රැස් කිරීමේ ශිල්ප ක්‍රම ද යොදාගෙන ඇත. ප්‍රතිචාරකයන් පනහකින් (50) යුත් ප්‍රශ්නාවලි ශිල්ප ක්‍රමයක්, මූලික වශයෙන් සරල සසම්භාවී නියැදි ක්‍රමය යටතේ යොදා ගන්නා ලදී. වඩාත් විචාරාත්මක මෙන්ම සැඟවුණු දත්ත සොයා ගැනීමට සම්මුඛ පරීක්ෂණ මෙන්ම ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා ක්‍රමය යොදා ගන්නා ලදී. මෙහි දී ගැඹුරු සම්මුඛ සාකච්ඡා විස්සක් ද (20) ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡා දෙකක් ද (02) යොදා ගන්නා ලදී. මේ සඳහා අරමුණුසහගත නියැදි ක්‍රමය යොදා ගන්නා ලදී. මෙම අධ්‍යයනය දෙහිඅත්තකණ්ඩිය ප්‍රදේශයේ සිදු කරන ලදී. ප්‍රාථමික දත්තවලට අමතරව ද්විතියික දත්ත, තොරතුරු හා අලි මිනිස් ගැටුම සම්බන්ධව ඇති සාහිත්‍ය වැඩි වශයෙන් යොදා ගනු ලැබූ නිසා මෙම දත්ත ප්‍රමාණාත්මක මෙන්ම ගුණාත්මක ලෙස විශ්ලේෂණය කරනු ලැබුවේය. ගුණාත්මක දත්ත විශ්ලේෂණයේ දී සමාජ විද්‍යාත්මක මෙන්ම මානව විද්‍යාත්මක සංකල්ප සහ කථිකාවත් වැඩි වශයෙන් භාවිත කරන ලදී. මේ සඳහා අලි මිනිස් ගැටුම සහ වියළි කලාපයේ පවුල් ජීවිතයට ඇති වන බලපෑම පිළිබඳ දේශපාලන ආර්ථිකය, පාරිසරික දේශපාලනය, අවදානම් සමාජ වෘත්තීවේදය විශ්ලේෂණ සඳහා යොදා ගනු ලැබීය.

## අලි මිනිස් ගැටුමේ දේශපාලන, ආර්ථික පසුබිම හා ඉතිහාසය

වර්තමානයේ උග්‍රව ඇති අලි මිනිස් ගැටුම අතීතයේ ජනගහන වර්ධනය මෙන්ම වනාන්තර විනාශය ද ප්‍රබල ලෙස බලපා ඇත. ශ්‍රී ලංකාවේ රජයන් විසින් අනුගමනය කළ සමාජ ආර්ථික හා කෘෂිකාර්මික ප්‍රතිපත්ති වන ආවරණය විනාශ වීමට හේතු සාධක විය. 1881 දී ආසන්න වශයෙන් 85% ක් වූ වනාන්තර ආවරණය, 1900 දී 70% ක් ද, 1956 දී 44% දක්වාත් අඩු විය. එය 1989 දී තව දුරටත්

28% දක්වා අඩු විය. අද වන විට ශ්‍රී ලංකාවේ වනාන්තර ආවරණය 15% ක් දක්වා පහත වැටී ඇත (තිලකරත්න, 2000). දැනට වාර්තා වී ඇති තොරතුරුවලට අනුව රටෙන් වැඩි කොටසක් වනාන්තර ලෙස පැවති තත්වයක සිට රටේ භූමියෙන් ඉතා සුළු කොටසක් වනාන්තරවලට සීමා වූ තත්වය දක්වා වර්ධනය වී ඇත. දැනට වසර 100 කට පෙර අලි ඇතුන්ට කැලයෙන් පිටට ඒමට කිසිදු අවශ්‍යතාවයක් නොවීය. එහෙත් අද තත්වය ඊට හාත්පසින්ම වෙනස් වී ඇත.

ශ්‍රී ලංකාවේ මෑත ඉතිහාසය සමාජ විද්‍යාත්මකව විමසා බැලීමේදී පෙනී යන්නේ වර්ධනය වූ ජනගහණය හා පහත වැටුණු වනාන්තර ආවරණය වනාන්තරවල ප්‍රධාන සත්ව කොට්ඨාසයක් වන අලි ඇතුන්ගේ පැවැත්මට ක්‍රම ක්‍රමයෙන් තර්ජන එල්ල කරමින් සිටීමයි. ලෝක සංරක්ෂණ සංගමය විසින් ප්‍රකාශයට පත් කළ (2007) රතු දත්ත පොතට අනුව වසරකට මෙරටට අහිමිවන වනාන්තර ප්‍රමාණය හෙක්ටයාර 33,000 කි. එම පොතේ සඳහන් වන ආකාරයට උභය ජීවී විශේෂ 21 ක් පසුගිය වසර 100 තුළ දී ශ්‍රී ලංකාවෙන් වාර්තා වී නැත. එය වාසභූමි හායනයේ ප්‍රතිඵලයක් ලෙස සඳහන් කළ හැකිය. එම වාර්තාවට අනුව ශාක 72 ක් වඳ වී යාමේ තර්ජනයට මුහුණ පා ඇත (කරුණාරත්න, 2011). අලි ඇතුන්ගේ වාසස්ථාන හා ඔවුන්ගේ පාරම්පරික වනකලාපයන් අහිමි වීමටත් අලි මිනිස් ගැටුම උග්‍ර අතට හැරෙන්නටත් ශ්‍රී ලංකාවේ රජයන් විසින් ක්‍රියාවට නැංවූ කෘෂි ආර්ථික ප්‍රතිපත්තිය ප්‍රධාන වශයෙන් බලපෑම් සිදු කළේය. කෘෂි ආර්ථිකය වඩාත් ශක්තිමත් කිරීමට 1840 හා 1935 දී ඉඩම් සංවර්ධනයට අදාළ ප්‍රධාන පනත් දෙකක් හඳුන්වා දෙනු ලැබුවේය ( Pieris, 1976).

වැවිලි කෘෂි කර්මාන්තයේ වර්ධනය අරමුණ කරගත් යටත්විජිත ප්‍රතිපත්තිය 1840 දී සියලු වනාන්තර, හේන්, පදිංචි නොවූ හා අයිතිය තහවුරු නොවූ ඉඩම් රජයට පවරා ගැනීම සඳහා රාජ්‍ය ඉඩම් පවරා ගැනීම හා සම්බන්ධ ආඥාව (මුඩු බිම් පනත) ඉදිරිපත් කළේය. 1840 දී බ්‍රිතාන්‍ය පාලකයන් හඳුන්වා දුන් මුඩුබිම් පනත මගින් ලංකාවේ ඉඩම් ප්‍රමාණයෙන් 90% ක් රජය සතු වූවා පමණක් නොව ඒ මගින් රජය පමණක් තෙත් කලාපයේ විශාල ඉඩම් ප්‍රමාණයක් වතු වගාව සඳහා විදේශිය හා දේශීය ව්‍යාපාරිකයන්ට විකිණීම සිදුවිය (Fernando, 2015). එමගින් මෙතෙක් උඩරට ප්‍රදේශයේ පැවැති පාරිසරික සමතුල්‍යතාවයන්ගේ විශාල වෙනසක් ඇති විය. අවුරුදු දහස් ගණනක් තුළ පවත්වාගෙන යන ලද තෙත් කලාපයේ වනාන්තර විශාල ප්‍රමාණයක් ශත වර්ෂයක් වැනි කෙටි කාලයක් තුළ වතු වගාව සඳහා එළිපෙහෙළි කරන ලදී. විශේෂයෙන්ම ගංගාවන්ට ජලය සැපයූ ජල පෝෂිත පෙදෙස්වල වනාන්තර විනාශ කිරීම නිසා විශාල පාරිසරික වෙනස්කම් මෙම ප්‍රදේශ තුළ ඇති විය. සිරිසේනට අනුව (2010), 1881 දී ලංකාවේ ඉඩම්වලින් 84% ක් පමණ වනාන්තරවලින් යුක්ත වුවත් 1890 වන විට එය 70% දක්වා අඩුවීමෙන් එම වෙනස්කම්වල බරපතලකම වටහාගත හැකිය. මේ අනුව යැපුම් ආර්ථිකයක්ව පැවැති ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යුහය ධනවාදී මාවතකට යොමු වීමත් සමගම මෙතෙක් පැවති පාරිසරික සමතුලිතභාවයේ යම් යම් වෙනස්කම් සිදුවිය.

ගුණාත්මක පර්යේෂණ දත්ත අනුව, මෙම ඉඩම් වැවිලි ආර්ථිකයට යොදා ගැනීම තවත් ප්‍රධානතම ගැටලුවක් වූයේ, එම වනාන්තරවල (මධ්‍යම කඳුකරයේ) ජීවත් වූ වනසතුන් විශාල වශයෙන් විනාශයට පත්වීමයි. මෙහිදී බොහෝ කුඩා සතුන් (වලසුන්, දිවියන්, වෘකයන් හා ගොනුන්) වේගයෙන් විනාශයට පත්වන අතර අලි ඇතුන් වැනි දැවැන්ත සතුන් තම සුවිශේෂ වූ ඥානය හා ශාරීරික ශක්තිය භාවිතයට ගනිමින් ඔවුන්ට වූ හානිය අවම කරගනිමින් ප්‍රදේශයෙන් ප්‍රදේශයට සංක්‍රමණය වෙමින් ජීවත් වන්නට හුරු පුරුදු විය. සමහරවිට මෙම අලි ඇතුන් මේ හේතුව නිසා ගොවිජනපදවල සිටි මිනිසුන්ට පහර දෙමින් ඔවුන්ගේ බෝගවලට ද හානි කරමින් තම පැවැත්ම තහවුරු කර ගත්තේය.

මෙම තත්වය නිදහසින් පසු මුල් යුගයේ බරපතල අර්බුදයක් නොවූවත් 1980 හා 90 දශකයේ ආරම්භයේ සිට මෙම ගැටුම වඩාත් උත්සන්න තත්වයට පත්විය. මීට අමතරව දේශීය කෘෂි ආර්ථිකය නගාසිටුවීම පිණිස 1935 දී හඳුන්වා දෙනු ලැබූ ඉඩම් සංවර්ධන පනත, ඉඩම් පරිහරණය, කෘෂි ආර්ථිකය හා ගොවිජනපද යන ක්ෂේත්‍රවල ප්‍රබල වෙනස්කම් රැසක් සිදු කළේය. 1935 න් පසු හඳුන්වා දුන් ඉඩම් සංවර්ධන ආඥා පනත අනුව ඉඩම් අහිමි වූවන්ට මෙන්ම වෙනත් අයට කෘෂිකර්මාන්තය නගාසිටුවීම පිණිසත්, විරැකියාව හා දරිද්‍රතාවය අවම කිරීමටත්, රජය සතු ඉඩම් ජනතාවට ලබාදී

ගොවිජනපද පිහිටුවන ලදී. ගල්ඔය, මිහින්තලේ, ගිරිතලේ, රාජාංගනය, මහඉලුක්පල්ලම, ජයන්තිපුර යනාදී ගොවිජනපද මෙසේ ආරම්භ කරන ලද ගොවිජනපදවලින් කිහිපයකි (Gamage & Aheeyar, 1998). මෙවන් ගොවිජනපද සඳහා විශාල වශයෙන් වනාන්තර එළිපෙහෙලි කළ අතර එමගින් තවදුරටත් වනසතුන්ගේ වාසස්ථාන අහිමි කළේය. එමෙන්ම මෙම ගොවිජනපද පිහිටුවීම සතුන්ගේ ජීවන රටාවට ද දැඩි තර්ජනයක් විය. නිදසුනක් ලෙස ගොවිජනපද වැඩි වශයෙන් පිහිටා ඇති අනුරාධපුර හා පොළොන්නරුව යන දිස්ත්‍රික්කවල වනආවරණය විශාල වශයෙන් අඩුවී ඇති අතර අද වන විට අලි මිනිස් ගැටුම උග්‍ර තත්වයට පත්ව ඇත. 1970 ගණන්වල මහවැලි ව්‍යාපාරය ආරම්භ වීමට පෙර උතුරු මැද නොයෙක් ප්‍රදේශ වනයෙන් වැසී පැවති අතර නව ජනාවාස හා ගොවි බිම් ඇති වීමත් සමඟ මෙම වන ආවරණ ශීඝ්‍රයෙන් අඩු වී ගියේය.

ඉහත සඳහන් පසුබිම තුළ වනාන්තර විනාශ වූ අතර ඉතිරි වනාන්තර කොටස් වශයෙන් කැඩී විසිරෙන තත්වයට පත්විය. මෙමගින් විශාල වනාන්තර වෙනුවට තැනින් තැන වූ කුඩා කැලෑ පමණක් ඉතිරි විය. එම නිසා අලි ඇතුන් ඇතුළු බොහෝ සතුන්ගේ ජීවිතවලට විශාල තර්ජනයක් එල්ල විය. එමගින් බොහෝ කුඩා සතුන් ස්වභාවයෙන්ම හා නොයෙක් මිනිස් ක්‍රියාකාරකම් නිසා වඳ වෙන්නට පටන් ගත්තේය. අනෙක් සතුන් මෙන් නොව අලි ඇතුන් තම ජීව විද්‍යාත්මක ජවය හා ඔවුන් තුළ දක්නට ලැබෙන සුවිශේෂ ඥානය මිනිස් ක්‍රියාකාරකම්වලට එරෙහිව ප්‍රතිරෝධයක් දැක්වීමට පෙළඹී ඇත. එමෙන්ම අලි ඇතුන්ගේ මෙම සුවිශේෂ ලක්ෂණය සමග ඔවුන් තුළ තිබෙන අලුත් පරිසරයට අනුවර්තනය වීමේ හැකියාව මිනිස් ජනපදවලට තර්ජන එල්ල කරන්නට තරම් ඔවුන්ව ශක්තිමත් තත්වයට පත්කොට තිබේ. මේ නිසා අලි ඇතුන් සහ අද වන විට රට පුරා පිහිටා ඇති ගොවිජනපදවල ජීවත්වන මිනිසුන් අතර ද්වන්ධ සටනක් හටගෙන ඇත. මෙහිදී දෙපාර්ශවයටම හානි සහ පරාජයන් සිදු වුවත්, ඔවුන් දෙපාර්ශවයම අඛණ්ඩව තම පැවැත්ම සඳහා අරගලයක යෙදී සිටීම නිරීක්ෂණය කළ හැකිය. මෙය අපගේ කෘෂි ආර්ථික ප්‍රතිපත්තියේ ව්‍යුහය මෙන්ම එහි ක්‍රියාකාරීත්වයට ස්වභාවයෙන්ම ඇති කරනු ලබන්නා වූ ඍජු හා අතුරු ප්‍රතිඵලයකි.

මෑත කාලීනව ස්වාභාවික සම්පත් කෙමෙන් විනාශ වෙමින් පවතින අතර සමහර සත්ත්ව හා ශාක වර්ග වඳ වෙමින් පවතී. මෙම තත්වයන් තුළ ශ්‍රී ලංකාවේ වර්තමානය වන විට පවතින පාරිසරික ගැටලු අතරින් වනසත්ත්ව හා මිනිස් ගැටුම ප්‍රබල තත්වයේ පසුවේ. එහිදී අඩු වැඩි වශයෙන් පවතින අලි - මිනිස් ගැටුම, රිලා -මිනිස් ගැටුම, කිඹුල් - මිනිස් ගැටුම, සහ දඬුලේන් - මිනිස් ගැටුම දැක්විය හැකිය.

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වාර්තාවලට අනුව සාමාන්‍යයෙන් අලි මිනිස් ගැටුම් නිසා වාර්ෂිකව දළ වශයෙන් මිනිස් ජීවිත 80ක් පමණ ද වනඅලි දෙසිය පනහක් පමණ ද අපට අහිමි වේ. වර්තමානයේ අලි මිනිස් ගැටුමේ බිහිසුණු බව විවිධ ප්‍රදේශවලින් වාර්ෂිකව වාර්තා වන ජීවිත හානි සහ අලි මරණ සංඛ්‍යාව දෙස බැලීමේ දී ඉතා හොඳින් පැහැදිලි වේ. පරාක්‍රම (2006) දක්වන ආකාරයට වනඅලින්ගෙන් මිනිස්සුන්ට වන හානි ලෙස තුවාල සහ මරණ සිදු කිරීම, නිවාස සහ දේපලවලට හානි සිදු කිරීම, වගාවන් විනාශ කිරීම දැක්විය හැකිය. ඔහු සඳහන් කරන ආකාරයට අලි මිනිස් ගැටුම්වලදී වැඩිම ජීවිත හානි ප්‍රමාණයක් හා වනඅලින්ගේ පහරදීම්වලට ලක්වී ඇති ප්‍රදේශය වශයෙන් දක්වනුයේ මහවැලි කලාපයයි. වැඩිම දේපල හානි සහ අලි මරණ ප්‍රමාණයක් වාර්තා වනුයේ වයඹ පළාතෙනි.

ඉහත සඳහන් කරුණු අනුව පැහැදිලි වන්නේ වියළි කලාපයේ වනාන්තර වාසභූමි කරගත් වන අලින් කෘෂි බිම්, මානව ජනාවාස, ජලාශ ගොඩනැගීම නිසා මහත් ප්‍රශ්න රැසකට මුහුණ පා සිටින බවකි. තම ගොදුරුබිම් සීමිත වීම, ආහාර හිඟය, ජල හිඟය, දෛනික හා වාර්ෂික සංක්‍රමණ රටාවට බාධාවන් සිදුවීම නිසා ඍජුවම කෘෂි බිම් ආක්‍රමණය කරනු පෙනේ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් මිනිස් වල් අලි ගැටුම වියළි කලාපයේ බොහෝ ප්‍රදේශවලින් වාර්තා වේ. වර්තමානයේ වර්ධනය වී ඇති අලි මිනිස් ගැටුමට ප්‍රධානම හේතුව වන්නේ ආර්ථිකය මුල් කරගත් සංවර්ධන ව්‍යාපෘති වේ. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වාර්ෂික වාර්තාවලට අනුව වසර 2000 සිට 2015 අතර වසර 15 ක කාලය තුළ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වාර්ෂික සංඛ්‍යා ලේඛන විමර්ශනය කිරීමේදී අලි මිනිස් ගැටුමේ ඇති බිහිසුණු බව අනාවරණය වේ. එහිදී වන අලි මරණ ශීඝ්‍රයෙන්

වර්ධනය වීමක් දැකගත හැකිය. එම කාලය තුළ වන අලි මරණ 3010 සිදුවී ඇති අතර වන අලි පහර දීම් නිසා මිනිස් මරණ 1003 ක් සිදු වී ඇත. ඒ අනුව අලි මරණ හා මිනිස් මරණ අනුපාතය ගත්කළ 3:1 අනුපාතයක් ගන්නා බව පැහැදිළිය.

**කෘෂිකාර්මික ජීවිකාව හා දරිද්‍රතාව**

කරුණාරත්න (2011) දක්වන ආකාරයට අලි මිනිස් ගැටුම වියළි කලාපයේ එක් ස්ථානයකට පමණක් සීමා වී නොමැත. අලි මිනිස් ගැටුම තීව්‍ර ලෙස පවතින ප්‍රදේශ වශයෙන් මඩුපාර , විල්පත්තුව, මහවැලි එච් කලාපය, කහල්ල - පල්ලෙකැලේ, මාදුරුඔය මිනිපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගලඋඩ, පමුණුපුර, දුන්ගොල්ල පදුගොල්ල, වේවරේ, කොළොන්ගොඩ, හීන් ගඟ, මහියංගනය, ගල්ඔය, දීඝවාපී, උඩවලවේ, මොණරාගල, හම්බන්තොට, ලුණුගම්වෙහෙර, හල්දුම්මුල්ල සහ යාල අවට ප්‍රදේශ දැක්විය හැකිය. දිවයිනේ සෙසු ප්‍රදේශවල ජන ජීවිතය හා සසඳන කළ වියළි කලාපීය ජන ජීවිතය පාරිසරික පීඩාකාරී තත්ත්වයන්ගෙන් ද දරිද්‍රතාවෙන් ද පෝෂණය වූවකි. ශ්‍රී ලංකාව තුළ දරිද්‍රතාව ගත් කල්හි දරිද්‍රතාවෙන් පෙළෙන මුළු ජනගහනයෙන් 80%ක් ජීවත් වන්නේ වියළි කලාපයේය (ගුණරත්න, 2009). වසරේ හරි අඩක්ම වියළි කාලගුණයකින් යුතු වියළි කලාපයේ ගොවි ජනතාවට ආහාර බෝග සපයනු ලබන්නේ වැසි කාල සීමාව තුළ පමණි. වැසි කාලයේදීත් නියං සමයේදීත් වියළි කලාපයේ ගොවිජනතාවට සිය ජීවිත හා දේපල වනජීවීන්ගෙන් ආරක්ෂා කර ගැනීමට මහත් අරගලයක් කරන්නට සිදු වී ඇත.

අලි මිනිස් ගැටුම වියලි කලාපයේ පවුල් ජීවිතය කෙරෙහි බලපාන ආකාරය පිළිබඳව විමසීමේදී කෘෂිකාර්මික ජීවිකාව හා දරිද්‍රතාව කෙරෙහි අලි මිනිස් ගැටුම බලපායි (අතපත්තු, 2011, Bandara, 2005). සම්මුඛ සාකච්ඡා මඟින් සොයාගත් දත්ත අනුව පසුගිය අවුරුදු කිහිපය තුළ වන ජීවීන්ගෙන් වගා හානි, දේපල හානි හෝ ජීවිත හානිවලට ලක් වූවාද යන්න විමසීමට ලක් කළ අතර ප්‍රතිචාරකයින්ගෙන් 100% ක් ප්‍රකාශ කරනු ලැබුවේ තමන්ට වනජීවීන්ගෙන් කිසියම් හෝ හානියක් සිදු වී ඇති බවයි. එසේ හානි පමුණුවන වනජීවීන්ගෙන් ප්‍රමුඛස්ථානය වනඅලියාට හිමි වූ අතර මොණරුන්ගෙන් හා වඳුරන්ගෙන් ද හානි සිදුවන බව ප්‍රකාශ කරන ලදී. නමුත් වනඅලියාගෙන් වන හානිය තරම් ප්‍රබල හානියක් වෙනත් වනජීවී විශේෂයකින් තමන්ට නොමැති බව ප්‍රතිචාරකයින්ගේ අදහස විය. අලි මිනිස් ගැටුම තමන්ගේ එදිනෙදා කාර්යයන් සිදු කරගැනීමේ දී ප්‍රබලව බලපෑම් එල්ල කරන බව ඔවුන් විසින් ප්‍රකාශ කරන ලදී. මෙහි දී සඳහන් කළ යුතු සුවිශේෂී කරුණ වන්නේ ප්‍රතිචාරකයින් සියලුදෙනාම වගා හානි, දේපල හානි හෝ ජීවිත හානි යන කුමන හෝ අවාසිදායක තත්වයකට අලි මිනිස් ගැටුම හේතුවෙන් ලක් වී ඇති බවයි. මේ අතරින් නිවාස හානිවලට මුහුණ පෑ ප්‍රතිචාරකයින්ගේ ප්‍රමාණය ඉහළ අගයක් ගන්නා අතර, නිවසේ උපකරණවලට මෙන්ම වාහන හානි ද සිදු වී ඇත. ගබඩා කළ වී, වනඅලි ප්‍රහාරවලට බොහෝ දුරට ලක්වන බව ගොවීන්ගේ අදහසයි. ගෙවතු වගාවල ඇති පොල්, කෙසෙල් වැනි වගාවන්ට දැඩි හානි සිදුවන බව ප්‍රතිචාරකයින් පෙන්වා දෙයි.

ගොවීන් සමඟ කළ සම්මුඛ සාකච්ඡාවලට අනුව වනඅලි ප්‍රහාර මගින් කෘෂි ආර්ථිකයට සිදු කරන බලපෑම පිළිබඳව විමසීමේ දී අලි මිනිස් ගැටුම නිසා වී ගොවිතැනට හානි සිදුවන බව බොහෝ දෙනාගේ මතයයි. ප්‍රතිචාරකයින්ගෙන් 90% ක් ප්‍රකාශ කරනු ලැබුවේ මීට පෙර අවස්ථාවලදී තමන්ගේ වී වගාවට වනඅලින්ගෙන් හානි සිදු වී ඇති බවයි. වර්ෂයක් තුළ එසේ සිදුවන හානි වාර ගණන 5-10 දක්වා පරාසයක ස්ථානගත වන අතර එක් වාරයකදී සිදුකරන හානි ප්‍රමාණය ගොවීන්ගේ දැනුමට අනුව මුළු වගාවෙන් 20%-40% අතර ප්‍රමාණයක රඳාපවතී.

බෝග වගාවන් සඳහා ද වනඅලින්ගෙන් හානි සිදුවේ. එහිදී වැඩි වශයෙන් ඉරිඟු වගාව හා කොමඬු වගාව කෙරෙහි බලපෑම් එල්ල වන අතර කුරහන්, කව්පි, මඤ්ඤොක්කා, වට්ටක්කා ආදිය ද අලින් ආහාරයට ගන්නා බව ඔවුන් විසින් පවසන ලදී. ගොවීන් විසින් වනඅලින්ගෙන් බෝග වගාවට වැඩි වශයෙන් හානි සිදුවන්නේ යල කන්නයේ දී බව ප්‍රකාශ කරන ලදී. ඊට ප්‍රධාන හේතුව වන්නේ මෙම කාලයේ දී වියළි සමය හේතුකොටගෙන වනඅලි ආහාර හා ජලය සොයා ගම්මාන කරා පැමිණීමයි. මෙම කෘෂි බෝග ආදායම බෝග වගා ක්‍රම අනුව වෙනස් වන බැවින් පවුලකට ස්ථිර ආදායම් මාර්ගයක් තිබේ නම් එම පවුල ගැටුම්වලට මුහුණ පෑමට තිබෙන ඉඩකඩ අඩුය.

මෙහිදි සඳහන් කළ යුතු සුවිශේෂි කරුණ වන්නේ අලි මිනිස් ගැටුම මුල් කරගෙන වියළි කලාපයේ ජීවත්වන පාරම්පරිකව ගොවිතැන් කටයුතු කරගෙන ආ මිනිසුන් බොහොමයක් වර්තමානයේ වෙනත් විකල්ප ආදායම් මාර්ග වන පෞද්ගලික අංශයේ රැකියාවල හෝ එදිනෙදා කුලී ශ්‍රමය සපයමින් තම ජීවිකාව සපුරා ගැනීමට යොමු වී තිබීමයි. මෙම හේතූන් නිසාම වක්‍රාකාරව ඔවුන් තවත් පරිසර හානිවලට යොමු වී ඇත. එහිදී ගඩොල් කර්මාන්තය, ගල් වලවල්වල සේවයට යාම, වැලි ගොඩදැමීමට අත් උදව්කරුවන් ලෙස යොමු වීම පැහැදිලිවම දැකගත හැකිය. ඒ අනුව **'කෘෂිකාර්මික පවුල'** යන තත්ත්වයෙන් මිදී **'කුලී ශ්‍රමික පවුල්'** බවට මෙම පවුල් ඒකකයන් පරිවර්තනයට ලක් වී ඇත. මෙම සියලු කරුණු අනුව පැහැදිළි වන්නේ ඔවුන් තමන්ගේ ආදායම් අහිමි කිරීමේ මානයන්ට ලක් වී ඇති බවයි.

ගුණරත්න (2009) අලි මිනිස් ගැටුම සහ දරිද්‍රතාව පිළිබඳ ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදුකර ඇත. එහිදී ගිරිබාව, ඇහැටුවැව, ලුණුගම්වෙහෙර, සහ පොල්පිතිගම යන ක්ෂේත්‍රයන් අධ්‍යයනය කරමින් පෙන්වාදෙන්නේ අලි මිනිස් ගැටුම හා ග්‍රාමීය දරිද්‍රතා අනුපාතය අතර සහසම්බන්ධතාවක් පවතින බවයි. එම දත්තවලට අනුව වාර්ෂිකව අලි මිනිස් ගැටුම නිසා වූ මිනිස් මරණ සංඛ්‍යාවේ මධ්‍යයනය 2.4 කි. දරිද්‍රතා අනුපාතය 24.8% කි. මෙම ප්‍රදේශ අතරින් ලුණුගම්වෙහෙර අලි මිනිස් ගැටුම මෙන්ම දරිද්‍රතාව ද වැඩි වී ඇත. එම ක්ෂේත්‍ර පර්යේෂණයට අනුව අලි මිනිස් ගැටුමේ විවිධත්වය හා දරිද්‍රතාව අතර පැහැදිලි සම්බන්ධතාවක් පවතින බව සොයාගෙන ඇත. අලි මිනිස් ගැටුම මිනිසුන්ගේ ආර්ථිකයට පමණක් නොව ඔවුන්ගේ බොහෝ සමාජ, සංස්කෘතික මෙන්ම දෛනික කටයුතුවලට බලපෑම් කරනු ලැබේ. මේවා අතර දරුවන්ගේ අධ්‍යාපන හා වෙනත් කටයුතු ප්‍රමුඛ වේ.

**අලි මිනිස් ගැටුම හා දරුවන්ගේ අධ්‍යාපනය**

මෙහිදී අලි මිනිස් ගැටුම දරුවන්ගේ අධ්‍යාපනය කෙරෙහි බලපෑම් ඇති කරන්නේද යන පැනයට පිළිතුරු වශයෙන් ප්‍රතිචාරකයන්ගේ අදහස වූයේ දරුවන්ගේ අධ්‍යාපනය කෙරෙහි වනඅලි ගැටලුව ප්‍රබලව බලපාන බවයි. එහිදී රාත්‍රි කාලයේ දී අධ්‍යාපන කටයුතුවල නිරත වීමට නොහැකි වීම ප්‍රධාන වේ. රාත්‍රී කාලයේ දී වනඅලි ප්‍රහාරවල අවදානම යටතේ ඔවුන්ට අධ්‍යාපන කටයුතු නිසියාකාරව සිදු කරගැනීමේ හැකියාවක් නොමැත. මෙම අවදානමට වඩාත් ලක්වන්නේ විදුලි බලය නොමැති නිවාසවල දරුවන්ය. වනඅලි ප්‍රහාර හේතු කොටගෙන ප්‍රතිචාරක ගෘහ ඒකකයන් තුළ පුද්ගලයන් මරණයට පත්ව ඇති අතර වනඅලි හානි හේතුවෙන් ආබාධිත තත්වයට පත් පාසල් සිසුවෙකු ද හඳුනාගත හැකි විය. එම මියගිය පුද්ගලයන් පුරුෂයින් වූ අතර වර්තමානය වන විට එම ගෘහ ඒකකයන්ගේ පවුලේ ගෘහ මූලිකයා බවට කාන්තාව පත් වී ඇත. මොවුන් තම ජීවිකාව සපුරා ගැනීම සඳහා ගඩොල් කර්මාන්තයේ නියැලෙයි. මෙවැනි තත්වයක් තුළ එම පවුලේ දරුවන්ගේ අධ්‍යාපනයට එය විශාල බාධාවක් වී ඇත. මන්ද දරුවන්ගේ අධ්‍යාපනයට අදාළ අවශ්‍යතා සපුරාලීමට මෙවැනි තත්වයක් යටතේ ඔවුන්ට ආර්ථික මෙන්ම මනෝවිද්‍යාත්මක සාධකයන් ද සෘණාත්මකව බලපා ඇති හෙයිනි.

එපමණක් නොව කෘෂිකර්මාන්තය ප්‍රධාන ජීවනෝපාය කරගත් පවුල්වල දරුවන්ගේ අධ්‍යාපනය සීමා වීමට බලපාන තවත් කරුණක් ලෙස ඔවුන් තම පියා සමඟ වනඅලින්ගෙන් වගා බිම් ආරක්ෂා කර ගැනීම සඳහා රාත්‍රී කාලයේ දී පැල් රැකීම වැනි කටයුතුවලට සහයෝගය ලබාදීම පෙන්වාදිය හැකිය. මේ අනුව කුඩා කාලයේ සිටම අවදානමට මුහුණ දෙමින් මෙම පවුල්වල දරුවෝ අධ්‍යාපනය ලබති. මෙම පවුල්වල දිළිඳුභාවය පැහැදිලි වන තවත් කරුණක් වන්නේ සාමාන්‍ය පෙළ අධ්‍යාපනය අවසන් වූ වහාම පවුල්වල පිරිමි දරුවන් හා ගැහැනු දරුවන් රැකියා අවස්ථා කෙරෙහි ප්‍රවේශ වීමයි. එම රැකියාවන් ඇඟළුම් කර්මාන්තශාලාව හෝ ආරක්ෂක අංශය නියෝජනය කරයි. ඒ අනුව ඉහළ ශ්‍රමය, අඩු සමාජ වැදගත්කම හා අවම වැටුප් සහිත අස්ථාවර මෙන්ම අවදානම් රැකියා ක්ෂේත්‍රයන් කරායොමු වීමට ඔවුන්ගේ අධ්‍යාපනය සීමා වීම් හා ආර්ථික අපහසුතා හේතු වී ඇත. වනඅලින්ගේ පීඩාවට අමතරව ග්‍රාමය තුළ පවතින අධ්‍යාපන අවස්ථා සීමා වීම ද මීට එක් හේතුවකි. ග්‍රාමයේ පාසල ද්විතියික අධ්‍යාපනයට පමණක් සීමා වන අතර ගොඩනැගිලි පහසුකම් අවම වීම, ගුරුවරුන්ගේ පුරප්පාඩු පැවතීම මෙහි දී සැළකිය යුතු කරුණු කිහිපයකි. මෙම පවුල්වල පවතින ආර්ථික අපහසුතා මධ්‍යයේ ඔවුන් පාසල් වෙත ළඟා කරන ප්‍රවාහන මාධ්‍යය බොහෝ විට

පාපැදියයි. මෙවැනි තත්වයක් තුළ ග්‍රාමයෙන් බාහිරව පවතින පාසල් කරා යෑම සඳහා අලුයම පිටත් විය යුතු අතර එවැනි අවස්ථාවල දී වනඅලින්ගෙන් වන හානිවලින් ආරක්ෂා වීමට ඔවුන්ට සිදු වේ. අලි මිනිස් ගැටුම පවතින ප්‍රදේශවල පාසල්වලට වනඅලින්ගෙන් හානි සිදුවන අතර එම ප්‍රදේශවල සේවය කිරීමට ගුරුවරුන්ගේ ද වැඩි කැමැත්තක් නැති බව වාර්තා වේ. අලි මිනිස් ගැටුම හා සම්බන්ධ අවදානම් තත්වය දරුවන්ගේ අධ්‍යාපනයට වක්‍ර ලෙස බොහෝ බලපෑම් එල්ල කරමින් සිටී.

**අලි මිනිස් ගැටුම හා අඹුසැමි සම්බන්ධතාවය**

අලි මිනිස් ගැටුම පවුල් ජීවිතයට එල්ල කරන බලපෑම පිළිබඳව විමසීමේදී අඹුසැමි සම්බන්ධතාව වැදගත් වේ. නමුත් මෙම මනෝ විද්‍යාත්මක සාධකයන් කෙරෙහි ද අලි මිනිස් ගැටුම බලපෑම් ඇති කරයි. පවුලේ ගෘහ මූලිකයා වන පුරුෂයා වනඅලින්ගෙන් වගාවන්ට වන හානි වළක්වා ගැනීම සඳහා පැල් රැකීම හෝ රාත්‍රී මුර සංචාරයේ යෙදෙනු ලබයි. ඒ බව ඔවුන් වන අලින්ගෙන් වගාව ආරක්ෂා කර ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳව විමසීමට ලක් කිරීමේදී 70% ක් තම වගාව ආරක්ෂා කරගැනීම සඳහා රාත්‍රී මුර සංචාරයේ යෙදෙන බව ප්‍රකාශ කිරීමෙන් පැහැදිලි වේ. මෙවැනි තත්වයක් තුළ අඹු සැමි සම්බන්ධතාවලට බාධාවන් එල්ලවන අතර එය ඔවුන්ට මානසික වශයෙන් බලපෑම් ඇති කළ හැකිය. ඊට අමතරව ග්‍රාමය තුළ අනියම් සම්බන්ධතා ඇති වීමේ ප්‍රවණතාවක් ද ඇති බව ප්‍රධාන ප්‍රතිග්‍රාහකයන් සඳහන් කළ අදහස් මගින් පැහැදිලි විය. එසේ ප්‍රකාශ කිරීමට හේතු වූයේ එවැනි සම්බන්ධතාවන් හේතුවෙන් ඇති වූ ආරවුල් විසඳීමට ග්‍රාම නිලධාරීවරයාට ද මැදිහත්වීමට සිදු වූ අවස්ථා බොහොමයක් පැවැති බවයි. පවුල් සංස්ථාව දෙදරායාම සඳහා මෙම තත්වයන් බලපෑම් ඇති කළ හැකි අතර ඉන් පවුල මගින් ඉටුකරන සමාජානුයෝජන කාර්යය, දරුවන් පෝෂණය කිරීම හා ඔවුන්ගේ ආරක්ෂාව මේ නිසාම අහිමි විය හැකිය. සෞඛ්‍ය වාර්තා පෙන්වාදන ආකාරයට ලංකාවේ සියදිවි නසාගැනීම් බහුලව වාර්තා වන්නේ වියළි කලාපයෙනි. මෙම තත්වය ඇතිවීමට අලි මිනිස් ගැටුම මගින් ඇති කරනු ලබන අඹුසැමි සම්බන්ධතා දුරස් කරවීම වක්‍රාකාරයෙන් දායකවීමක් සිදුවනවාද යන්න සැක සහිතය.

මෙයට අදාළව කරුණු සාකච්ජා කිරීමේදී විවාහය සම්බන්ධ ලබාගත් තොරතුරුද වැදගත් වේ. විශේෂයෙන්ම ප්‍රදේශයේ පවතින පහසුකම් අවම වීම මෙන්ම වර්තමානයේ උද්ගත වී ඇති අලි මිනිස් ගැටුම මේ සඳහා ප්‍රබල බලපෑමක් වී ඇති බව බොහෝ දෙනාගේ අදහසයි. එහිදී සාමාන්‍ය සිංහල සංස්කෘතික විවාහයක පවතින සීමා බන්ධන එනම් පොරොන්දම් ගැළපීම, ජාති ආගම්, කුල භේදයන්ට අමතරව මෙම ප්‍රදේශය තුළ පවතින අලි මිනිස් ගැටුම විවාහයකදී ප්‍රධාන තීරක සාධකයක් බවට පත්ව ඇත. බොහෝවිට ස්ත්‍රී පාර්ශවයේ විවාහයන් ග්‍රාමයෙන් පිටත සිදු වුවද පුරුෂ පාර්ශවයේ විවාහයන් ග්‍රාමය තුළට සීමා වී ඇති බව ප්‍රතිචාරකයින් පෙන්වාදෙයි. ඊට හේතුව වන්නේ තරුණියන් බොහෝවිට ඇඟළුම් කර්මාන්තයේ රැකියා අවස්ථාවලට යොමු වී ග්‍රාමයෙන් බැහැර විවාහ සම්බන්ධතා ඇති කර ගැනීම සහ තරුණයන් විවාහක තරුණියන් සමඟ තම ප්‍රදේශය තුළ පදිංචි වීම යන කාරණය. මේ අනුව ප්‍රදේශයේ විවාහය කෙරෙහි අලි මිනිස් ගැටුම හේතු වී ඇති අතර සමාජීය වශයෙන් බැහැර කිරීමට ඔවුන් ලක් වේ.

**මිනිස් ජීවිත හානි සහ වන්දි ක්‍රමය**

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ 2016 වර්ෂයේ දත්තවලට අනුව වර්ෂ 2005 සිට 2015 දක්වා අවුරුදු දහයක කාලසීමාව තුළ මහවැලි වනජීවී කලාපයේ සිදු වී ඇති මිනිස් මරණ සංඛ්‍යාව 174 කි. මෙම දත්ත පිළිබඳ පහත පරිදි සරල විශ්ලේෂණයකට පැමිණිය හැකිය. එම තොරතුරුවලට අනුව මිනිස් මරණ වැඩි වශයෙන් සිදුවෙන කාලය රාත්‍රී කාලයයි. එය මුළු මිනිස් මරණ ප්‍රමාණයෙන් 75% කි. ඒ අනුව පැමිණිය හැකි සරල නිගමනය වන්නේ රාත්‍රී කාලයේදී නිවසින් බැහැරව සිටින වැඩිහිටි පිරිමි පාර්ශ්වය අලි ප්‍රහාරවලට ලක්වී ඇති බවයි. මිනිස් මරණ සිදුවන ස්ථානයන් පිළිබඳ සැළකීමේ දී මුළු මිනිස් මරණ ප්‍රමාණයෙන් වගා ආරක්ෂාවේදී සිදුවන මරණ ප්‍රමාණය 50% වන අතර ඇතැම් පුද්ගලයින් ඉතාම අනාරක්ෂිතව බිම සාදාගත් පැල්වල සිට මරණයට පත් වී ඇති අවස්ථා වාර්තා වී ඇත. ඔවුන්ගේ ප්‍රධාන ජීවනෝපාය ගොවිතැනය. ඔවුන්ට ගොවිතැනින් ලැබෙන ආදායම තම පවුලේ පැවැත්ම තීරණය කරන ප්‍රධානම සාධකයයි. එවැනි තත්වයකදී තමන්ගේ පවුලේ පැවැත්ම වෙනුවෙන් ගොවියෝ තම ගොවිතැන ආරක්ෂා කරගැනීම සඳහා ගත හැකි සෑම පියවරක්ම ගනිති.

එම හේතුව නිසාම වන අලින්ගෙන් සිදුවන ප්‍රහාර මගින් බොහෝදුරට ගොවියන් මරණයට පත්වන්නේ වගා ආරක්ෂාවේදීය. ඒ බව මෙම දත්තවලට අනුව වනඅලි ප්‍රහාරවලින් මරණයට පත්වන පිරිස 85% පුරුෂයින් වීම තුළ ඒ බව වඩාත් පැහැදිලි වේ. එම මරණයන්ට වැඩි වශයෙන් ගොදුරුවීමේ වයස් කාණ්ඩය ගතහොත් වයස අවුරුදු 40 ට වැඩි පිරිමි පාර්ශ්වයයි. එය 83% ක ප්‍රමාණයකි. මෙම වයස් කාණ්ඩය පිළිබඳව අවධානයට ලක් කිරීමේදී ඔවුන් බොහෝවිට විවාහ සංස්ථාවට ඇතුළත් වී ඇත. ඒ අනුව ග්‍රාමීය කෘෂිකාර්මික පවුල් ඒකකය තුළ ප්‍රධාන ආදායම් උපයන්නා බවට පුරුෂයා පත්ව ඇත. ගෘහ මූලිකයා කෘෂිකර්මාන්තයෙන් ලබාගන්නා ආදායම මත එම පවුලේ සුබසාධන කාර්යයන් තීරණය වේ. එනම් පවුලේ සාමාජිකයන්ගේ අධ්‍යාපනය, සෞඛ්‍යය, පරිභෝජනය වැනි අවශ්‍යතා සපුරාගනු ලබන්නේ ගොවිතැනෙන් ලැබෙන ආදායමෙනි. නමුත් වනඅලි ප්‍රහාර මගින් මරණයට වැඩි වශයෙන් පත්වන්නේ ද පුරුෂයා වීම තුළ ඔවුන්ගේ පවුල් ඒකකයට හිමිවන එකම ආදායම් මාර්ගය ද අහිමි වේ. එය කෘෂිකාර්මික පවුල් ඒකකයේ දරුවන්ගේ අධ්‍යාපනය, සෞඛ්‍ය ඇතුළු සුබසාධන කාර්යයන් කෙරෙහි බලපෑම් ඇති කරන අතර ධනාත්මක සමාජ, ආර්ථික ප්‍රවේශයන් ඔවුන්ට අහිමි වේ.

අලි මිනිස් ගැටුමෙන් මහජනතාවට එල්ලවන ප්‍රබලම බලපෑම වන්නේ ආර්ථිකයට එල්ලවන බලපෑමයි (Bandara, 2005). වන්දි පිරිනැමීම හා රක්ෂණ ක්‍රමයක් හඳුන්වාදීම මගින් මේ සඳහා විසඳුම් ලබා දීමට රජය උත්සාහයක නිරත වේ. වර්තමානය වනවිට වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා සමාජ සේවා දෙපාර්තමේන්තුව ඇතුළු රාජ්‍ය ආයතන කිහිපයක් මගින් අලි මිනිස් ගැටුමෙන් විපතට පත් වූවන් සඳහා වන්දි ක්‍රම කිහිපයක් ක්‍රියාත්මක කර තිබේ. ඒ අනුව අලින්ගෙන් එල්ලවන ප්‍රහාරවලින් සිදුවන හානි සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් වන්දි පිරිනමන අතර වගා හානි සඳහා වන්දි පිරිනැමීම සිදුවන්නේ සමාජ සේවා දෙපාර්තමේන්තුව මගිනි. නමුත් පවත්නා වන්දි ක්‍රමය අලි මිනිස් ගැටුමෙන් පීඩාවට, දරිද්‍රතාවයට පත්ව ඇති පවුල් ඒකකයන් එම තත්ත්වයන්ගෙන් මුදාගැනීම සඳහා ප්‍රමාණාත්මක වගකීමක් ඉටු නොකරන බව කරුණු සාකච්ඡා කිරීමේදී පැහැදිලි වේ.

මෙහිදී කිවයුතු අනෙක් කාරණය වන්නේ අලි මිනිස් ගැටුම හේතු කොටගෙන සිදුවන ජීවිත හානි හෝ බෙලහීනතාවයට පත්වීම සඳහා වන්දි ලබාදීම සිදුකළ පසු රාජ්‍ය මගින් එම ජනතාව පිළිබඳ වගකීම නිමා කිරීමයි. ගෘහ මූලිකයා මියගිය අවස්ථාවකදී ඔහුගේ හෝ ඇයගේ අවමංගල්‍ය කටයුතු කිරීම සඳහා මුදල්මය දායකත්වය පමණක් ලබාදීම ප්‍රමාණවත් බව සහ එය ජනතාවගේ වගකියන රාජ්‍යයක ප්‍රමාණවත් කාර්යභාරය ලෙස හඳුනාගෙන ඇත. වන්දි ලබාදීමෙන් පමණක් මෙම කෘෂිකාර්මික පවුල්වල ඇති වන සමාජ, ආර්ථික තත්ත්වයන් සමථයකට පත් කළ හැකිද? පවුල් ඒකකයේ ඕනෑම පුද්ගලයෙකු පූර්ණ හෝ අර්ධ බෙලහීනතාවයට පත් වූ පසු ඔහුගෙන් හෝ ඇයගෙන් පවුලට හා සමාජයට ඉටු කරන ලද සහ ඉටු කිරීමට බලාපොරොත්තු වූ කාර්යභාරය නැවත පෙර පරිද්දෙන්ම ඉටුකළ හැකිද? මේ නිසාම මෙවැනි අවස්ථාවන්ට මුහුණ දෙනු ලබන පුද්ගලයින්ට තම සමාජයීය හෝ ආර්ථිකමය අනාගත අභියෝග ජය ගැනීමට අවශ්‍ය සමාජයීය පසුබිම සකස් කළ යුතුය.

පවත්නා වන්දි ක්‍රමය මගින් වනඅලි ප්‍රහාර මගින් සිදුවන දේපල හානි සඳහා වන්දි මුදල් පිරිනැමීමේදි නිවසේ ස්වභාවය, භාවිතා කර ඇති අමු ද්‍රව්‍ය ආදිය සළකා බැලීමක් සිදුවේ. නිවාසයෙහි අත්තිවාරම සකස්කර ඇති අමුද්‍රව්‍ය, බිත්ති සකස්කර ඇති අමුද්‍රව්‍ය (ගඩොල්, බ්ලොක්ගල්, මැටි ආදී වශයෙන්) වහලය සකස්කර ඇති අමුද්‍රව්‍ය (උළු, තහඩු, පොල් අතු හා වෙනත් පිදුරු වැනි අමුද්‍රව්‍යයක් ද යන වග) නිවාසයකට වන්දි ලබා ගැනීමේදී මූලික සුදුසුකම් බවට පත් වේ. ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත අනුව ප්‍රතිචාරකයන් 80% ට මෙම වන්දි ක්‍රමය තුළ අලින්ගෙන් සිදුවන දේපලහානි වෙනුවෙන් ඉහළ වන්දි මුදලක් ලබාගැනීමේ හැකියාව නොපවතී. දරිද්‍රතාවයෙන් පෙළෙන පුද්ගලයෙකුට කිසිසේත්ම නිවසකට වැඩි වන්දි මුදලක් ලබාදීමට අවශ්‍ය අමුද්‍රව්‍යයන් භාවිතයක් හෝ ගෘහ උපකරණ භාවිතයක් හෝ පරිහරණය කිරීමක් කිසිසේත්ම බලාපොරොත්තු විය නොහැකිය.

ග්‍රාමීය සමාජයේ කෘෂිකර්මාන්තය ප්‍රධාන ජීවනෝපාය කරගත් අලි ප්‍රහාරවලට ලක් වී ආර්ථිකය අතින් තවදුරටත් පහළ සිටින ගොවියෙකුගෙන් බලධාරීන් බලාපොරොත්තු වන ආකාරයේ

සුඛෝපභෝගී ජීවිතයක් අපේක්ෂා කළ හැකිද? මෙවැනි තත්වයක් තුළ අවම පහසුකම් ඇති කෘෂිකාර්මික පවුලකට දේපල හානියකට ලැබෙන වන්දි මුදල් ප්‍රමාණය අඩුවීම පමණක් නොව තවදුරටත් ඔවුන් සමාජ, ආර්ථික වශයෙන් පහළ තත්ත්වයකට පත් නොවන්නේද? මෙහිදී මතුවන අනෙක් සමාජ විද්‍යාත්මක කරුණ වන්නේ දේපල වන්දි ලබාදීමේ වෙනස්කම එක් පිරිසකට වාසිදායක වන ආකාරයටත් තවත් පිරිසකට අවාසිදායක තත්වයටත් හේතු සාධක සපයන බවයි. උදාහරණයකින් පැහැදිලි කරන්නේ නම් වනඅලි ප්‍රහාර හේතු කොටගෙන සම්පූර්ණයෙන්ම නිවාසය හානියට පත් වූ ඉහත සඳහන් වාණිජමය වටිනාකමක් ඇති නිවාස අමුද්‍රව්‍ය භාවිතා කළ හා උසස් තත්ත්වයේ ගෘහ උපකරණ භාවිතා කළ දේපල සහිත නිවාස හිමියෙකුට ලැබෙන වන්දි මුදල සහ අවම පහසුකම් යටතේ දරිද්‍රතාවයෙන් පෝෂණය වූ නිවාස හිමියෙකුට ලැබෙන වන්දි මුදලෙහි වෙනසක් ඇත. ඒ අනුව මෙම ක්‍රමවේදයන් මගින් සමාජය තුළ තවදුරටත් ඇති නැති පරතරය ඇති කිරීමට සමත්වන බව කිව හැකිය. ඒ අනුව වනඅලි නිසා හානියට පත් වූ තම ජීවිත සහ දේපල සඳහා රජයෙන් සිදුවන මැදිහත්වීම හරහා නැවතත් ගොඩනගා ගැනීමට මෙම ජනතාවට යම්කිසි බලාපොරොත්තුවක් පැවතුන ද එය ද පවත්නා වන්දි ක්‍රමය යටතේ අහෝසි කරදමා ඇත.

මීට අමතරව පවත්නා වන්දි ක්‍රමය යටතේ අලින්ගෙන් සිදුවන වගා හානි සඳහා සමාජ සේවා දෙපාර්මේන්තුව මගින් වනඅලි විසින් වගාවලට සිදුකරන හානි සඳහා රු. 8000/- ක උපරිමයකට යටත්ව වන්දි මුදලක් ගෙවනු ලබයි. වනඅලි විසින් සිදුකරන වගා හානිවලින් ද ඔවුහු පීඩාවට පත්ව සිටිති. ගොවියෝ පැහැදිලි කළ ආකාරයට එක් රාත්‍රියක් හෝ තම වගාවන් වනඅලින්ගෙන් ආරක්ෂා කරගැනීමට නොහැකි වුවහොත් ඔවුන්ගේ වගාවන්ට සිදුවන හානිය එම ගෘහ ඒකකයන්ගේ දරිද්‍රතාවය තවත් ශක්තිමත් කරයි. ඒ අනුව වගා හානි සඳහා ලබාදෙන උපරිම වන්දි මුදල රුපියල් 8000 ක් වන අතර ගොවීන් විසින් වගාවන් සඳහා යොදා ගන්නා ශ්‍රමය, කාලය සහ මුදල් සමඟ සසඳන කළ මෙම වන්දි මුදල් ප්‍රමාණය කිසිසේත්ම ප්‍රමාණවත් නොවන බව කිව යුතුය.

වන්දි ක්‍රමය පිළිබඳව ජනතා අදහස් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් වනඅලි හානි සඳහා වන්දි මුදලක් ලබාගැනීමට ගොවීන් තුළ ඇති කැමැත්ත විමසීමට ලක් කළ අතර 70% ක් ඒ සඳහා කැමැත්ත පළ කළ අතර 30% ක් ඊට අකැමැත්ත ප්‍රකාශ කරන ලදී. වන්දි ලබා ගැනීමට අකැමැති වීමට හේතු පිළිබඳ විමසීමට ලක් කිරීමේදී වන්දි ලබා දීමේ ක්‍රියාදාමය පිළිබඳ ඇති අවිශ්වාසනීයත්වය ගොවීන් විසින් වන්දි ලබාගැනීම ප්‍රතික්ෂේප කිරීම සඳහා ප්‍රධාන හේතුවක් විය. රාජ්‍ය යාන්ත්‍රණ පරිපාලනයේ ඇති දුර්වලතා හේතුවෙන් වන්දි ලබා ගැනීමට යාමේදී විවිධ දුෂ්කරතා මතුවේ. ඒ බව සියලුම ප්‍රතිචාරකයින් විසින් දරන ලද අදහස විය. බොහෝ අවස්ථාවලදී වන්දි ලබාගැනීම සඳහා නගරයට සහ අදාළ රාජ්‍ය ආයතනයට වාර ගණනකදි පැමිණීමට සිදුවන අතර වන්දි මුදල මුදාහැරීම සඳහා විශාල කාල සීමාවක් ලබාගන්නා බව ගොවීන් විසින් කරනු ලබන තවත් චෝදනාවකි. එසේම වන්දි ලබා ගැනීම සඳහා විවිධ ලිපිලේඛන සම්පූර්ණ කිරීමට සිදුවන අතර ජනතාවගේ නොදැනුවත්භාවය හේතු කොටගෙන බොහෝ වන්දි ලබා ගැනීමේ ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප වන බව ලබාගත් තොරතුරුවලට අනුව පැහැදිලි වේ.

වගා හානි සඳහා වන්දි පිරිනැමෙන්නේ වගාවේ අස්වැන්න පදනම් කරගනිමින් මිස හානි සිදුවූ වගාවට නොවීම තවත් හේතුවකි. හේන් වගාව සඳහා වන්දි නොලැබෙන අතර ස්ථිර වගාවන් සඳහා පමණක් ඒවා හිමි වේ. වන්දි ක්‍රමයේ පවත්නා බරපතල ගැටලු වන්නේ අදාළ වන්දිය ප්‍රමාණවත් නොවීම හා එය ලබා ගැනීමට දිගු කාලයක් ගත වීමය. වගා සහ දේපල හානි සඳහා වන්දි පිරිනැමීමේ දී ද සෘණාත්මක බලපෑම් ඇතිවිය හැකිය. මන්දයත් බොහෝ විට ඒවා ලබා ගැනීමේදී සැබෑ තක්සේරුවට වඩා වැඩි තක්සේරුවක් ප්‍රකාශ කිරීමත්, වැරදි තොරතුරු ලබා දීමත් නිසා ඒවා පිරිනැමීම සිදුනොවීම හේතුවෙනි.

**ජීවිත අවදානම හා ජන ජීවිතයේ අනුවර්තනයන්**

අලි මිනිස් ගැටුම බලපෑම් එල්ල කරන තවත් සාධකයක් වන්නේ ගමනාගමන කටයුතුවලදීය. ගමනාගමන කටයුතුවලදී ග්‍රාමයේ ජනතාව මුහුණ දෙන ප්‍රධාන ගැටලුව වන්නේ සෞඛ්‍යය පහසුකම් අවම වීමයි. යම් රෝගයකට ප්‍රතිකාර ලබාගැනීම සඳහා ඔවුන් කිලෝමීටර ගණනාවක් ගෙවා රෝහල වෙත යා යුතුය. මෙහිදි සඳහන් කළ යුතු කරුණ වන්නේ ගැබිණි මව්වරුන් තම ප්‍රසූත දිනයට දින

කිහිපයකටම පෙර සිට රෝහල්ගත වීමයි. ඇතැම් අවස්ථාවලදී බරපතල රෝගී පුද්ගලයින් රාත්‍රී කාලයේදී රෝහල්ගත කිරීම සඳහා තම ජීවිත අවධානම පිළිබඳ නොතකා ජනතාව කටයුතු කරයි. එසේම අලි මිනිස් ගැටුම හේතුවෙන් ඔවුන් පීඩාවට ලක් වී සිටින අතර හදිසි තත්වයන්හි ඇතිවන රෝගයන්ට ප්‍රතිකාර ලබා ගැනීමේදී විවිධ දුෂ්කරතාවලට ලක්වේ. මෙවැනි අවස්ථාවලදී රෝගියාගේ ජීවිතයට පවා අනතුරුදායක තත්වයක් ඇතිවිය හැකිවන්නේ රාත්‍රී කාලයේදී ඇතිවන රෝගී තත්වයන්ට ප්‍රතිකාර ලබා ගැනීමට යාම වනඅලි ගැවසීම නිසා සිදු කළ නොහැකි වීමයි. එමෙන්ම වනඅලි මිනිස් ගැටුම හේතු කොටගෙන ඔවුන්ට දැඩි මානසික බලපෑමක් කිරීමට සමත්වී ඇත. නිරන්තරයෙන් ජීවිත අවදානම පිළිබඳව සැළකිලිමත්වීමට ඔවුන්ට සිදුවේ. ග්‍රාමයේ ගොවීන් පෙන්වා දුන් අනෙක් කරුණ වන්නේ රාත්‍රී කාලයේදී වනඅලින්ගෙන් සිදුවන හානිවලින් ආරක්ෂාවීම සඳහා නිදි වර්ජිතව සිටීම ඔවුන්ගේ එදිනෙදා කාර්යයන් කරගැනීමට අපහසුතා ඇතිකරවන බවයි. මෙවැනි තත්ත්වයක් තුළ ඔවුන්ට කායික හා මානසික රෝගයන්ට ගොදුරුවීමේ ඉඩකඩ ඉතා වැඩිය.

ජනතාව නිරන්තරයෙන් තමා වටා ඇති අවදානමට අනුවර්තනය වේ (මහීස්, 2012).  වනඅලින් විසින් සිදුකරනු ලබන අනතුරු හා වගා හානි වළක්වා ගැනීමට මෙන්ම එම අවදානම් තත්ත්වයන්ට අනුවර්තනය වීමක් මෙම ප්‍රදේශය තුළ හඳුනාගත හැකිය. වනඅලින් විසින් සිදු කරනු ලබන අනතුරු හා වගා හානි වළක්වා ගැනීම සඳහා ප්‍රදේශයේ ගොවීන් විසින් යොදාගනු ලබන උපක්‍රමයන් ලෙස අලි වෙඩි දැමීම, රතිඤ්ඤා දැල්වීම, ගිනිමැල ගැසීම, ශබ්ද කිරීම, පරීක්ෂාවෙන් සිටීම, ගස් මුදුන්වල කූඩාරම් තැනීම, කුඹුරු මායිමේ ලන්තෑරුම් දැල්වීම, මුර සංචාරය, විවිධ පාරම්පරික ක්‍රම, සංස්කෘතික හැඩගැසීම යනාදිය දැක්විය හැකිය. ඒ අනුව තමන්ට ඇති වී ඇති අවදානම් තත්වයන්වලට මුහුණ දීම සඳහා මෙම විවිධ වූ ක්‍රියාමාර්ග ගනු ලබයි.

අඛණ්ඩ අලි මිනිස් ගැටුම හේතු කොටගෙන ප්‍රදේශයේ ගොවීන් ඔවුන් පාරම්පරිකව කරගෙන ආ ගොවි කටයුතුවලින් තමන්ට සරිලන ප්‍රතිලාභයක් ලබමින් සිටිය ද වර්තමානයේ මෙහි උද්ගත වී ඇති අලි මිනිස් ගැටුම හේතුවෙන් පාරම්පරිකව ප්‍රදේශයට ආවේණික බෝග වැවීම අතහැර වෙනත් විකල්ප බෝග වගාවන් සඳහා පෙළඹී ඇත.  මෙහිදී ඔවුන් වඩාත්ම උත්සුක වී ඇත්තේ වනඅලි පිළිකුල් කරන බෝගයන් වගා කිරීමට මිස ප්‍රතිඵල වැඩි මෙම ප්‍රදේශයට සුදුසු බෝග තෝරා ගැනීමට නොවේ. මෙම බෝගවලින් ලැබෙන ප්‍රතිලාභ පෙර ඔවුන් පාරම්පරිකව සිදුකරගෙන පැමිණි ගොවිතැන් කටයුතුවලින් ලැබුණු ප්‍රතිලාභවලට වඩා බොහෝ අඩු වුවත් පවතින ගැටුම්කාරි තත්ත්වය හේතුවෙන් ඔවුන්ට එම තත්ත්වයන්ට සරිලන ආකාරයට හැඩගැසීමට සිදු වී ඇත.

බොහෝ මහවැලි ගොවීන්ගේ නව ප්‍රවණතාව වන්නේ දුම්කොළ වගාව හා රටකජු වගාව කෙරෙහි යොමුවීමයි. රටකජු වගාව මඟින් යම් ඵලදායිතාවයක් ලබා ගත්තද දුම්කොළ වගාව හේතුවෙන් විශාල ප්‍රශ්න රාශියක් උද්ගත වී ඇත. මෙම ප්‍රශ්නවලට වඩාත්ම හේතුකාරකය වී ඇත්තේ එක් අතෙකින් මේවාට යොදන පොහොර ප්‍රමාණය හා කෘමිනාශක ද්‍රව්‍යයන්ට අධික වියදමක් දැරීමට සිදුවීමයි. නමුත් වෙනත් බෝග සඳහා අලින්ගෙන් වන හානිය, ඒවා ආරක්ෂා කරගැනීමට යොදවන කාලය, ශ්‍රමය, මුදල් වැය කිරීම අතින් ගත් කළ තමන්ට මෙම බෝගයන් තුළින් ප්‍රමාණවත් ආදායමක් නොලැබුණද එම පීඩනය හමුවේ ඔවුන් මෙම විකල්ප වගාවන් කරා යොමු වී ඇත. මෙහි ජනතාවගේ ප්‍රධාන ජීවන මාර්ගය බවට පත් වූයේ කෘෂිකර්මාන්තයයි. ඉන් ලබාගන්නා ආදායම මගින් තම පවුලේ පැවැත්ම පවත්වාගෙන යාමට මෙම ගොවියන් විශාල කැපකිරීමක් සිදු කරයි. මෙම හේතුව නිසාම පාරම්පරිකව සිදු කරගෙන පැමිණි වී ගොවිතැනින් තම පවුලේ පැවැත්මට ප්‍රමාණවත් දායකත්වයක් ලබාදීමට නොහැකි බැවින් අලින් අප්‍රිය කරන ආගන්තුක බෝග වගාවන් කෙරෙහි යොමු වීමට ඔවුන්ට සිදු වී ඇත. මෙම වගාවන් ඔවුන් මීට පෙර අවස්ථාවලදී නොයැලීම හේතුවෙන් එම වගාවන් නඩත්තු කිරීමේ නිවැරදි ක්‍රමයන් පිළිබඳව අවබෝධයක් නොමැත. මේ හේතුවෙන්  ඔවුන්ට මෙම විකල්ප බෝග වගාවන් මගින් ප්‍රමාණවත් ආදායමක් ලබා ගැනීමට දැඩි පරිශ්‍රමයක් දැරීමට සිදු වී ඇත. නමුත් ගොවියන් මෙම අවදානම පිළිබඳව නොසිතා මෙම වගාවන්ට යොමු වී ඇත්තේ වනඅලි වී ගොවිතැනට හානි සිදු කිරීමෙන් වළක්වාගැනීම සඳහා ඔවුන්ට බොහෝ ක්‍රියාකාරකම්වලට යොමු වීමට සිදුවන නිසාවෙනි. මෙයින් ඔවුන් අවම ආදායමක් උපයාගත්ත ද වන අලි පීඩනය හමුවේ ඔවුන්ට එම ආදායමෙන් සෑහීමකට පත්වීමට සිදු වී ඇත.

දෙහිඅත්තකණ්ඩිය ප්‍රදේශය තුළ සිදුකරන ලද අධ්‍යයනයට අනුව මෙහිදී සඳහන් කළ යුතු සුවිශේෂී කරුණ වන්නේ අලි මිනිස් ගැටුම අවම කරගැනීම සඳහා විවිධ ක්‍රියාකාරකම් භාවිතා කිරීමට ජනතාව උනන්දු වූ අතර ඒ මත පදනම්ව තම චර්යා රටා හැඩගස්වා ගැනීමට ද ඔවුන් පෙළඹීමයි. මෙම සංස්කෘතික හැඩගැසීම පිළිබඳව සාකච්ඡා කිරිමේදී වර්ෂය පුරා ඇතිවන කාලගුණික වෙනස්කම් අලි මිනිස් ගැටුමට අතිශයින්ම බලපාන කරුණකි. කාලගුණික වෙනස්කම් සමඟ බෝග රටාව ද වෙනස්වන නිසා අලි ඇතුන්ගේ පැමිණීම සීමා කිරීමට එම වගා රටා හා ක්‍රමෝපායන් අනුගමනය කරනු ලබයි. ඇතැම් වේලාවන්හිදී ගොවීන් තම වගා පිළිවෙලෙහි කාලය වෙනස් කිරීමට පෙළඹෙන්නේ අලි ඇතුන්ගේ පැමිණීම වෙනස් කිරීමේ අරමුණෙනි. මීට අමතරව ඔවුන් අකැමැති බෝග එනම් පිළිකුල් කරන ඉඟුරු හා දුම්කොළ වැනි වගාවන් කිරිම, කපුරු මල් වැවීම ආදිය මඟින් අලි ඇතුන්ගේ පැමිණීම හා ඔවුන්ගෙන් වන හානි අවම කරගනු ලබයි. කෘෂිකාර්මික කටයුතුවලදී විවිධ කෙම් ක්‍රම, අභිචාර විධි, පුද පූජා ආදියට පුරුදුව සිටි ඔවුන් ඒ සමඟම වනඅලින්ගෙන් වගාවන්ට වන හානි අවම කරගැනීම සඳහා මෙම ක්‍රම යොදා ගැනීම දැකිය හැකිය. මතුරන ලද ගල් වගා බිමේ සතර කොණ වළ දැමීම, දෙවියන්ගේ වාහනය ඇතා කරගත් සමන් දෙවියන්ට බෝග ආරක්ෂා කර දෙන මෙන් බාර වී පඬුරු ගැට ගැසීම ආදිය සිදුකරනු ලබයි. විශේෂයෙන්ම මෙහිදී කාන්තාවන් ප්‍රකාශ කරනු ලැබූ කාරණය වූයේ සමන් දෙවියන්ට බාර වීම තුළ අලින්ගෙන් සිදුවන හානි අවම වීම තමන් අත්දැකීමෙන් දන්නා කරුණක් බවයි.

යම්කිසි ජන කොටසක් වඩාත් අවදානම් තත්වයට පත්වන විට ඔවුන් එම අවදානම් මගින් තව තවත් අනුකලනය වී සාමූහිකව එක්ව ක්‍රියාකරන්ට කටයුතු කරනු ලබයි (Beck, 1992). වියළි කලාපයේ ගොවීන් තම අසල්වැසියාගේ ගොවිපලට හෝ දේපලවලට හානි සිදුකිරීමේදී මිනිසුන් ප්‍රජාවක් ලෙස එක්වී වනඅලි පළවා හැරීම සඳහා කටයුතු කරයි. මේ තුළ එකිනෙකා කෙරෙහි පැවැති අමනාපකම් දුරුවී ඇත. සියලුදෙනාම වනඅලින්ගෙන් පීඩනයට ලක්වී සිටින මිනිසුන් යන හැඟීම ඔවුන් තුළ ඇත. මේ සමඟම පුද්ගලයින්ගේ පෞරුෂයේ ඇතිවන වෙනස්කම් ප්‍රධාන වේ. පුද්ගලයා එතෙක් තනි පුද්ගලයෙකු ලෙස කටයුතු කළ ද සමූහයක් ලෙස සාමූහිකව කටයුතු කිරීමට පෙළඹී ඇත. වන අලි විසින් සිදු කරන මිනිස් ජීවිත හානි නිසා ජනතාව නිරන්තරයෙන් රජයට හෝ රජයේ නිලධාරීන්ට විරුද්ධව උද්ඝෝෂණ හා සමූහ විරෝධතාවල යෙදීම අලි මිනිස් ගැටුම නිසා බිම් මට්ටමේ ඇති වූ සාමූහික විඥානයට කදිම නිදසුනකි.

Douglas & Wildavasky (1982) ට අනුව අවදානම සංස්කෘතියේ කොටසක් බවට පත්වන අතර එමඟින් නව ආකාරයේ අවදානම් සන්නිවේදනයක් ද ඇති වේ. අනෙක් වැදගත් කරුණ වන්නේ අලි මිනිස් ගැටුමට මුහුණදෙන ප්‍රජාව පාරිසරික අවදානම තුළ අභියෝගයන්ට මුහුණදෙන අතර එම අභියෝගයන් සාක්ෂාත් කරගැනීමෙහිලා පවතින අවදානම් තත්ත්වයන්ට අනුවර්තනය වී ඇති බවයි. එහිදී වනඅලි ප්‍රහාරවලින් ආරක්ෂා වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග බොහොමයක් ඔවුන්ගේ ජීවිත අවදානම අවම කරගැනීම සඳහා උපකාරී වී ඇත. ඒ හේතුවෙන් අවදානම් සන්නිවේදනය මගින් ප්‍රදේශයට අනන්‍ය වු සමාජ, සංස්කෘතික රටාවක් බිහි වී ඇති බව කිව හැකිය. ලබාගත් දත්ත අනුව අලි මිනිස් ගැටුම හේතුවෙන් කිසිම පවුලක් මෙම ප්‍රදේශය අත්හැර නොයා තිබීම විශේෂත්වයකි. ඔවුන් තමන්ට ඇතිවන අවදානම් තත්වයන්ට මුහුණ දෙමින් එම අවදානම් තත්වයන් තමන්ගේ දෛනික ජීවිතයේ අභියෝගයන් බවට පත්කරගෙන ඇත. විශේෂයෙන්ම ඔවුන් අලින්ගෙන් සිදුවන වගා හානිවලට විසඳුමක් වශයෙන් අලි පිළිකුල් කරන බෝග වගාවන්ට යොමු වී ඇත. එමඟින් තම ආර්ථිකය සවිමත් කරගැනීමට ඔවුන් උත්සාහ කරයි. මේ සෑම ක්‍රියාකාරකමකම අවසාන ප්‍රතිඵලය වන්නේ ඔවුන් පවතින අවදානම් තත්වයන් මඟහැර නොයා එම අවදානම් තත්වයන්ට අනුවර්තනය වීමයි.


මේ අනුව පැහැදිලි වන්නේ පාරිසරික ගැටලුවක් යනු හුදෙක් අප ඉදිරියේ භෞතික වශයෙන් දක්නට ලැබෙන හෝ අපට දැනෙන ගැටලුවක් පමණක් නොව පරිසරය පිළිබඳව අනාගතයේ ඇති විය හැකි අවදානම් තත්ත්වයකි. Ulrich Beck නම් සමාජ විද්‍යාඥයා තම Risk Society (1992) නම් කෘතියේ දක්වන ආකාරයට වර්තමානයේ අප ජීවත්වන සමාජයේ නොයෙක් ආකාරයේ අවදානම් හා අනතුරු තත්ත්වයන්ගෙන් පිරී පවතින බවයි. වියළි කලාපයේ අලි මිනිස් ගැටුම නිසා පාරිසරික වශයෙන් ඇති වී තිබෙන හෝ ඇති වීමට නියමිත අවදානම් තත්ත්වය ඉතා වැදගත්ය. එම අවදානම

සංස්කෘතික වශයෙන් තවදුරටත් නිර්මාණය කරනු ලබයි. ඒ අනුව මෙම ප්‍රදේශයේ ජනතාව අලි මිනිස් ගැටුමේ පීඩනයට ලක්ව එදිනෙදා ජීවිතය ගත කරන අතර එම පීඩනයන්ට ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කරගැනීමට විවිධ වූ කටයුතුවල නිරත වේ. මෙහිදී වනඅලි හානි ඔවුන්ගේ දෛනික ජීවිතයේ එක් කොටසක් වී ඇත. ඔවුහු එම ජීවන ක්‍රමයට හැඩගැසෙමින් ජීවිතයේ අභියෝගයන්ට එදිරිව මුහුණදෙන අතර අවදානම හා අනතුරු සහිත නව සංස්කෘතිය නිර්මාණය කරමින් වියළි කලාපයේ ජන ජීවිතය නව දිසාවකට යොමුකරමින් සිටිති.

**අලි මිනිස් ගැටුම කළමනාකරණය උදෙසා සමාජ වෘත්තිවේදය**

වර්තමානයේ ලොව පුරා ඇතිවෙන පාරිසරික ගැටලු විසඳීමට සමාජ වෘත්තිවේදීන්ගේ කාර්යභාරය වැදගත් වේ (Bay, 2010). ඔහු තවදුරටත් පවසන්නේ වර්තමානයේ අප හමුවේ තිබෙන තිරසර නොවන බොහෝ ගැටලු විසඳා ගැනීමට සමාජ වෘත්තීවේදය ප්‍රායෝගිකව යොදාගත හැකි බවයි. Dewane (2011) සඳහන් කරන්නේ පාරිසරික ගැටලු හමුවේ ජනතාවට සිදුවන අයුක්තිය හා දෛනික ජීවිතයේ මුහුණදෙන ගැටලුවලට සමාජ වෘත්තිවේදය මගින් විසඳුම් ලබා දිය හැකිබවය. වනසත්ව හා මිනිස් ගැටුම අවම කිරීමට ඒ පිළිබඳ සමාජ වෘත්තිවේද පදනම් කොටගත් ප්‍රවේශයක් තුළ අදහස් දක්වන Inglehart & Baker (2000) පෙන්වා දෙන්නේ ජනතාව තම සංස්කෘතිය හා ජීවිකාව වෙනස් කරගැනීමෙන් මෙම ගැටලුවට යම් ආකාරයක විසඳුම් සොයාගත හැකි බවයි. එමෙන්ම ඒ වෙනුවෙන් පශ්චාත් භෞතික (post material) ජීවන රටාවකට ඔවුන්ව සමාජ වෘත්තිවේදය මගින් පුහුණු කළ යුතුය.

ගෝලීය පර්යේෂණ තුළින් පෙන්වාදෙනු ලබන්නේ අලි මිනිස් ගැටුම වැනි සමාජ පරිසර ගැටලුවලට සමාජ වෘත්තිවේදයෙන් යම් ආකාරයක විසඳුමක් ලබා ගත හැකි බවයි. දිගින් දිගටම පවතින මෙම ගැටුම තුළ නිරන්තරයෙන්ම වනඅලින්ව පාලනය කරන්නට හෝ ඔවුන්ව වෙනත් ස්ථාන කරා ගෙන යන්නට උත්සාහ කරමින් සිටී. නමුත් ඒවා අද වන විට අසාර්ථක වී ඇත. මිනිසුන්ට සාපේක්ෂව සතුන්ට පරිසරයට හෝ අභියෝග හමුවේ අනුවර්තනය වීමේ හැකියාව ඉතා අඩුය. නමුත් මිනිසුන්ට ඔවුන්ගේ බුද්ධිය, තාක්ෂණය මෙන්ම සංස්කෘතිය යොදා ගනිමින් අවශ්‍ය පරිදි තමන්ව යම් පරිවර්තනයකට ලක් කර ගන්නට හැකිය. එම නිසා මෙම ගැටලුව අවම කරගන්නට අලි මිනිස් ගැටුමෙන් බැට කන වියළි කලාපයේ ජනයාගේ ආකල්ප, ඔවුන්ගේ බෝග වගාවත්, ඔවුන්ගේ පදිංචිය මෙන්ම ඔවුන්ගේ ජීවන රටාව වෙනස් කරන්නට ඉතා ප්‍රායෝගිකව පරිසරය සංරක්ෂණය මුල් කොට ගත් හරිත සමාජ වෘත්තිවේද භාවිත කළ හැකිය. මේ සඳහා පහත සඳහන් ආකාරයෙන් හරිත සමාජ වෘත්තිවේදය (green social work) යොදා ගනිමින් පුද්ගලයා, පවුල මෙන්ම ප්‍රජාව වෙනස් කරන්නට හැකිය.




**නිගමනය**

ලාංකේය සමාජයේ වියළි කලාප නිරන්තරයෙන්ම සුවිශේෂී ජීවන රටාවක් හා සංස්කෘතියක් නිර්මාණය කොට ඇත. අද වනවිට ප්‍රධාන සමාජ, පරිසර ගැටලුවක්ව පවතින අලි මිනිස් ගැටුම වියළි කලාපයේ ජන ජීවිතය හා ඔවුන්ගේ පවුල් ඒකකය තවත් බොහෝ වෙනස්කම්වලට හා අභියෝගවලට ලක් කොට ඇත. විශේෂයෙන්ම පවුල් ඒකකයට සිදුවන බලපෑම් ආර්ථික හා

සංස්කෘතික යන දෙයාකාරයකින් විශ්ලේෂණය කළ හැකිය. මෙම ලිපියට අදාළව කරුණු සම්පිණ්ඩනය කර බැලීමේදී පැහැදිලි වන්නේ මෙම ප්‍රදේශයේ ජනතාවගේ සමාජ, ආර්ථික වශයෙන් අලි මිනිස් ගැටුම හේතු කොටගෙන නොයෙක් පීඩනයට ලක් වී ඇති බවයි. අලි විසින් කෘෂිකාර්මික කටයුතුවලට හානි සිදුකිරීම පවුලේ දරිද්‍රතාවය කෙරෙහි බලපාන ආකාරය අවම වශයෙන් ප්‍රධාන කාරණා තුනක් ඔස්සේ සාරාංශගත කළ හැකිය. එනම් බෝගවලට සිදුවන හානිය ඉහළ යාම සහ අලි විසින් සිදු කරනු ලබන දේපල හානි නිසා ඇතිවන ආර්ථික පාඩුව ඉහළ යාම, දැනට ගොවීන් විසින් භාවිතා කරනු ලබන බෝග ආරක්ෂා කිරීමේ ක්‍රමවල ඵලදායිතාව අවම වීම, අලි විසින් හානි කරන ලද දේපල හා වගා හානි සඳහා ලබාදෙන වන්දි මුදල් ප්‍රමාණාත්මක නොවීම යනාදියයි.

අලි මිනිස් ගැටුම හේතුවෙන් වියළි කලාපයේ ජන ජීවිතය හා ඔවුන්ගේ පවුල් ඒකකයට සංස්කෘතික වශයෙන් සිදුවන බලපෑම මෙම ලිපිය තුළ විශේෂයෙන් ඉස්මතු වී ඇත. අලි මිනිස් ගැටුම නිසා අඹුසැමි සම්බන්ධතාවයට එල්ලවන බලපෑම්, එම නිසා පවුල තුළ ඇතිවන අනෝමීය තත්වය, දරුවන්ගේ අධ්‍යාපනයට එල්ලවන බලපෑම් ඉතාමත් තීරණාත්මක සාධක වේ. විශේෂයෙන්ම අලි මිනිස් ගැටුම හේතු කොට ගෙන විවාහක පුරුෂයන් මියයාම නිසා වියළි කලාපයේ පවුල් ඒකකය නොයෙක් ආර්ථික හා සංස්කෘතික අර්බුදවලට ලක්වෙමින් සිටී.

මීට අමතරව වියළි කලාපයේ අලි මිනිස් ගැටුම නව ආකාරයක දේශපාලනයක් ග්‍රාමීය මට්ටමට හඳුන්වා දී ඇත. එනම් අලි මිනිස් ගැටුම ආශ්‍රිතව වන්දි ගෙවීම, එහි ඇතිවන අක්‍රමිකතා, අලි වැටවල් සකස් කිරීම හා වෙනත් ආරක්ෂක ක්‍රම ආශ්‍රිත බල සම්බන්ධතා මෙන්ම අලි මිනිස් ගැටුම සමඟ ඇතිවන උද්ඝෝෂණ හෝ විරෝධතා එම ප්‍රදේශයේ නව දේශපාලන ප්‍රවණතාවක් ඇති කොට ඇත. අවසාන වශයෙන්, වියළි කලාපයේ අලි මිනිස් ගැටුම එම ප්‍රදේශවල නව ගැමි සංස්කෘතියක් නිර්මාණය කරමින් තිබේ. අලි මිනිස් ගැටුම හේතුවෙන් අලුත් බෝග හා වගාවන්වලට හුරුවීම, වන අලින් පලවාහරින නව උපක්‍රම සොයා ගැනීම, නව අවදානම් සන්නිවේදනයක් ගැමි සමාජයට සකස් කරදීම, අවදානම් තත්වය සමඟ එයට අනුවර්තනය වෙමින් ජීවත්වීම මෙම නව ජන ජීවන ප්‍රවණතා ලෙස හැඳින්විය හැකිය. වියළි කලාපයේ ජන ජීවිතය මුළුමනින්ම පාහේ අක්‍රමික තත්වයට පත් කරන අලි මිනිස් ගැටුම යම් ආකාරයකට පාලනය කරගැනීම සඳහා හරිත සමාජ වෘත්තිවේදය සාර්ථක වී ඇති බව ගෝලීය වශයෙන් සිදු කරන ලද පර්යේෂණවලින් පෙනී යන්නේය. එම නිසා ලාංකේය සමාජය තුළ ද අලි මිනිස් ගැටුම අවම කිරීමෙහිලා ප්‍රජාව එයට උචිත වන පරිදි සංරක්ෂණය කිරීම පිණිස ව්‍යවහාරික මෙන්ම හරිත සමාජ වෘත්තිවේදය යෝග්‍ය බව පෙනී යන්නේය.

**ආශ්‍රිත ග්‍රන්ථ**


අතපත්තු. ඩී., 2011. *ආර්ථික විද්‍යා ප්‍රවේශය.* කර්තෘ ප්‍රකාශනයකි.

අබේගුණවර්ධන. පී. සහ සේනාරත්න. ඒ., 2002. *ස්වාභාවික සම්පත් සහ පරිසර ආර්ථික විද්‍යාව.* කැස්බෑව : කර්තෘ ප්‍රකාශනයකි.

අමාත්‍ය මණ්ඩල සංදේශ. 2004. *අංක 025/2004 යටතේ වල් අලි හානි සඳහා වන්දි ගෙවීම* බත්තරමුල්ල: වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව.

කරුණාරත්න. එච්.කේ.එන්., 2011[a]. *ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය සහ මෑතකාලීන පාරිසරික අර්බුද.* පුංචි බොරැල්ල: විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

කරුණාරත්න. එච්.කේ.එන්. 2011[b]. *'ශ්‍රී ලංකාවේ මිනිස් වල් අලි ගැටුම ක්ෂේත්‍රීය රටාව සාධක සහ විසඳුම්' In: Parlimentary Research Journal.* Sri Jayawardanapura: Parliament of Sri Lanka.

ගුණරත්න. එල්.එච්.පී., 2009. *අලි මිනිස් ගැටුම සහ ග්‍රාමීය දරිද්‍රතාවය.* කෘෂි ව්‍යාපාර මධ්‍යස්ථානය.

තිලකරත්න. ඩබ්.එම්., 2000. *ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිපත්ති තිරසර සංවර්ධනය සහ වන විනාශය.* පේරාදෙණිය: සමාජීය විද්‍යා අධ්‍යයන කේන්ද්‍රය.

පරාක්‍රම. පී., 2006. 'හිත් පිත් නැති මිනිසුන් හමුවේ වැනසෙන අලි පරපුරේ කඳුළු කතාව' *මිහිමඬල*, 07-21.

මායාදුන්නේ. පී. සහ රොමේෂන්. කේ., 2013. *නාගරික දරිද්‍රතාවය මැනීම සඳහා භාවිතා කරන දරිද්‍රතා මිනුම්වල යෝග්‍යතාවය.* කොළඹ: දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රයේ (CEPA) ප්‍රකාශනයකි.

රුවන්පතිරණ. එන්., 1998. 'විසිඑක්වන සියවසේ වන ක්ෂේත්‍රයෙහි අභියෝග හා ධරණීය ජීවන ක්‍රමය' *වන විදුරාව*, 17-19.

සිරිසේන. ඩබ්.එම්., 2010. *පාරිසරික සමාජ විද්‍යාව.* වරකාපොල: ආරිය ප්‍රකාශකයෝ.

Mahees. M.T.M., 2012. 'සංවර්ධනය හා පාරිසරික දේශපාලනය' *In Parlimentary Research Journal*. Sri Jayawardanapura: Parliment of Sri Lanka.

Bandara. R., 2005. *The Economics of Human-Elephant Conflict*. Battaramulla: Ministry of Environmental and Natural Resource.

Beck. U., 1992. *Rick Society. Towards a New Modernity*.London: Sage Publication.

Douglas. M. & Wildavasky, A., 1982. *Risk and Culture, an essay on the selection of technological envirobnemtal danger*. Berkely: University of California Press.

Fernando. K.K.B.N., 2015. *A Study of social and political impact on the present title registration system under Bim Saviya Project in Sri Lanka*. Thesis submitted to the Faculty of Graduate Studies of University of Colombo.

Gamage. D. and Aheeyar. A., 1998. *Economic and Social factors affecting land degradation in the Upper Mahaweli Catchment***.** Sri Lanka: Environmental Action Project by Ministry of Forestry and Environmental.

Naughton. L. Rose, R. and Treves. A., 1999. *The social dimension of human-elephant conflict in Africa: A literature review and case studies from Uganda and Cameroon*. A eport to the African Elephant Specialist, Human-elephant Task, Conflict Task Force Group of IUCN, Glands, Switzerland.

Pieris. R., 1976. *Social Development and Planning in Asia*. New Dillhi: Abhinav Publication.